**ශ්‍රී ලංකා ජනාධිපති**
**இலங்கை சனாதிபதி**
**President of Sri Lanka**

# දීපාවලි පණිවිඩය

ලොව පුරා හින්දු බැතිමත්හු දීපාවලි දින පහන් දල්වමින් අවිද්‍යාවේ අන්ධකාරය පරදා ප්‍රඥාවේ ආලෝකය අපේක්ෂාවෙන් පුද පූජාවන්හි නිරත වෙති.

සියලූ දනන් සිත් සතන් ආලෝකමත් වේවා යන ප්‍රාර්ථනය ගැබ් කර ගත් දීපාවලි දිනය එකිනෙකා වෙත හෘදයාංගම ශුභාශිංසන පිරිනමමින් සෙනෙහස හා දයාව බෙදා හදා ගන්නා සංස්කෘතික උළෙලක් ලෙස ද වැදගත්කමක් උසුලයි. ඒ අරුතෙන් ගත් කල සහෝදරත්වයේ අපේක්ෂා පෙරදැරිව වාර්ගික හා ආගමික සංහිඳියාවත්, අන්‍යෝන්‍ය අවබෝධයත් වර්ධනය කරනු වස් මෙවන් සංස්කෘතික අංග මනා පිටිවහලක් වන බව මගේ හැඟීමයි.

සමස්ත ලෝකයම කොරෝනා වසංගතය නිසා උද්ගත දැවැන්ත අර්බුද රැසකට මුහුණ දී සිටින මේ මොහොතේ ආගමික වතාවත්හි නිරත වීම මිනිස් හදවත්වලට සැනසිල්ලකි. දීපාවලි සමයේ ඒ සැනසීම වෙනුවෙන් අපේ රටේත් ලෝකයේත් සියලූ හින්දු බැතිමතුන් ඒකාත්මිකව දෙවියන් වෙනුවෙන් කැපවනු ඇතැයි මම විශ්වාස කරමි. එය අප අරමුණු කරගත් යහපත් සමාජයක්, සෞභාග්‍ය සම්පන්න ජන ජීවිතයක් ගොඩ නැගීමට ආශිර්වාදයක් වනු ඇතැයි මම සිතමි.

මේ ආලෝකයේ මංගල්‍යය සමරන සැමට ඉන් අපේක්ෂිත සතුට මානසික සහනය සැලසේවා යි ප්‍රාර්ථනා කරමි.

ගෝඨාභය රාජපක්ෂ

**2020** නොවැම්බර් මස **14** වන දින